# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1679/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 06 /11 /2024
පැය 1845

## මාධ්‍ය නිවේදනය

**අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු සහ සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2024.11.05 වන දින දහවල් කාලයේදී මීගහවත්ත පොලිස් වසමේ උඩුපිල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 508 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් සහ ඊට ආධාර අනුබල දුන් සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකාරියන්ට මත්ද්‍රව්‍ය ලබා දීම සඳහා කාර් රථයකින් පැමිණි පුද්ගලයෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 507 ක් සන්තකයේ තබාගෙන සිටියදී කාර් රථයද සමඟ අත්අඩංගුවට** ගෙන මීගහවත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, සැකකාරියන් අවුරුදු 37 හා 58 වයස්වල පසුවන උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචි මව හා දියණිය වේ.**

මීගහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**